කව්සිළුමිණ කතුවරයා සිය මූලාශ්‍රය වශයෙන් කුස ජාතකය යොදා ගෙන ඇති ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

An Analitycal Study on How the Author of Kavsilumina used the Kusa Jataka as his source material

පී. එස්. ගොඩකන්ද

Abstract

The major epic poem added to Sinhala literature during the Dambadeniya period is Kavsilumina. Written by King Parakramabahu II, it is based on the Kusajataka, which is the 514th story in the Sinhala Jataka Katha Sangraha (collection of Jataka tales). Since Kavsilumina is written in accordance with the conventions of a major epic, the author's intention was not to simply translate the source story as it is into verse. Therefore, the Kusajataka was rendered into verse as Kavsilumina with some parts retained as they were, others omitted, and still others added and somewhat edited. This reveals the differences, similarities, and sometimes weaknesses between the Kusajataka and Kavsilumina. Thus, the research problem here is to identify how the author used the source story in writing Kavsilumina. The aim of this research is to investigate how the Kusajataka from the Jataka Katha Sangraha was edited when it was used as the source for Kavsilumina. The research methodology used is the qualitative method, where data is collected through library observation, revisions of the Pansiya Panas Jataka Potha (Five Hundred Fifty Jataka Book) and Kavsilumina,

and research articles, journals, newspapers, and lecture notes. Accordingly, the developed instances and weaknesses of Kavsilumina compared to the Jataka story can be seen, but overall, it appears that the Kavsilumina poet, compared to other poets who engaged in versification based on Jataka stories, has shown a clear proficiency in selecting appropriate instances.

Key words: Dambadeniya, Kavsilumina, Kusajataka, Lyric Poetry, Major Epic

සාරසංක්ෂේපය

දඹදෙණි යුගයේ දී සිංහල සාහිත්‍යයට එකතු වන මහා කාව්‍ය වන්නේ කව්සිළුමිණ යි. එය දෙවන පරාක්‍රමබාහු රජුගේ පබැඳුමක් වන එය සිංහල ජාතක කතා සංග්‍රහයෙහි 514 වන කතාන්දරය වශයෙන් දැක්වෙන කුස ජාතකය වස්තු විෂය කරගනී. කව්සිළුමිණ රචනා වන්නේ මහාකාව්‍ය ආකෘතියට අනුගත ව වන බැවින් මූලාශ්‍රය කතාව ඒ ආකාරයෙන් ම කවියට නැඟීම කව්සිළුමිණ කතුවරයාගේ අභිමතාර්ථය නොවීය. එහෙයින් ඇතැම් අවස්ථා ඒ ආකාරයෙන් ද, තවත් අවස්ථා බැහැර කරමින් ද බැහැරින් කොටස් එකතු කරමින් ද යම්තාක් දුරට සංස්කරණය කර කුස ජාතකය, කව්සිළුමිණ නමින් ගීයට නැඟීය. එය කුස ජාතකය හා කව්සිළුමිණ අතර වෙනස්කම් ද සමානතා සහ ඇතැම් විටෙක දුර්වලතා ද විද්‍යමාන කරයි. එබැවින් කව්සිළුමිණ රචනා කිරීමේ දී කතුවරයා මූලාශ්‍රය කතාව යොදා ගෙන ඇත්තේ කෙසේ ද යන්න හඳුනා ගැනීම මෙහි පර්යේෂණ ගැටලුව යි. ජාතක කතා සංග්‍රහයෙහි එන කුස ජාතකය කව්සිළුමිණ කවියා මූලාශ්‍රය කර ගැනීමේ දී සංස්කරණයට ලක් වී ඇති ආකාරය පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. ඒ සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල නිරීක්ෂණය, පන්සිය පනස් ජාතක පොතෙහි සහ කව්සිළුමිණෙහි සංස්කරණ, පර්යේෂණාත්මක ලිපි, සඟරා, පුවත්පත් හා දේශන සටහන් ආශ්‍රයෙන් දත්ත එක්රැස් කිරීම

සිදු වේ. ඒ අනුව ජාතක කථාවට සාපේක්ෂ ව කව්සිළුමිණෙහි සංවර්ධිත අවස්ථා සහ දුර්වල තැන් ද දකින්නට ලැබෙන නමුත් සමස්තයක් වශයෙන් සලකා බැලීමේ දී ජාතක කථා ඇසුරු කරගෙන කාව්‍යකරණයේ නියැළී සෙසු කවීන්ට වඩා කව්සිළුමිණ කවියා කාව්‍යෝචිත අවස්ථා තෝරා බේරා ගැනීමේ දී පැහැදිලි නිපුණත්වයක් දක්වා ඇති බව පෙනෙයි.

ප්‍රමුඛ පදඃ කව්සිළුමිණ, කුස ජාතකය, ගී කාව්‍ය, දඹදෙණිය, මහාකාව්‍ය

01. හැඳින්වීම

අනුරාධපුර හා පොළොන්නරු යන රාජධානිවලින් පසු ව උදා වූ යුගය හෙවත් ක්‍රි.ව. 1232 - 1284 කාලයදඹදෙණි රාජධානි යුගය මෙන් ම දඹදෙණි සාහිත්‍ය යුගය වශයෙන් ද සැලකේ. කව්සිළුමිණෙහි කතුවරයා වන දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් සාහිත්‍යකරණයෙහි නියැලුණු පඬිවරුන්ට දක්වන ලද නොමඳ අනුග්‍රහය හේතුවෙන් මෙම යුගයේ සම්භාව්‍ය සිංහල සාහිත්‍ය කෘති අතරට අතිශයින් ම වැදගත් කෘති කිහිපයක් ම දායාද විය. යෝගාර්ණවය, කර්මවිභාගය, සිදත් සඟරාව, එළු සඳස් ලකුණ, සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, දඹදෙණි අස්න, විසුද්ධි මාර්ග සන්නය සහ රජුගේ දින චර්යාව ඇතුළත් කඳවුරු සිරිත ඉන් කිහිපයකි.

දෙවන පරාක්‍රමබාහු රචනා කළ පළමු කෘතිය ලෙස පිළිගැනෙන්නේ විසුද්ධි මාර්ග සන්නය යි. එය 5 වන සියවසේ මෙරටට වැඩම කළ බුද්ධඝෝෂ නම් අටුවාචාරීන් විසින් රචනා කරන ලද විසුද්ධි මාර්ගය නමැති පාලි ග්‍රන්ථයේ සුඛාවබෝධය පිණිස සැකසුණු පරිකථාවක් හෙවත් ව්‍යාඛ්‍යානයකි. ඔහුගේ දෙවන කෘතිය වන කව්සිළුමිණ මුළුමනින් ම සංස්කෘත කාව්‍ය සම්ප්‍රදාය අනුව යමින් රචිත කෘතියකි. භාරතීය අලංකාරිකයෙකු වන දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය සිංහලයට අනුවර්තනය කොට සියබස්ලකර සම්පාදනය වීමත් සමඟ බුද්ධ චරිතය තේමා කරගනිමින් ද, ගී කාව්‍ය ආකෘතියට අනුගත වෙමින් ද,

සර්ගබන්ධනාදී ලක්ෂණ අනුගමනය කරමින් ද මහාකාව්‍ය රචනා කිරීමේ සම්ප්‍රදාය මෙරට සංස්ථාපනය විය. ඒ අනුව සිංහල කවීන් වැඩිම සංඛ්‍යාවක් සිය කෘති සඳහා පාදක කරගත් කුස ජාතකය මූලාශ්‍රය කරගෙන සර්ග 15කින් හා විවිධ ගී විරිත් අනුව පබැඳි පද්‍ය 767කින් සමලංකෘත ව නිම වන කව්සිළුමිණ දැනට විද්‍යමාන පැරණිතම සහ අග්‍රගන්‍ය ම සිංහල මහා කාව්‍ය ලෙස සිංහල සාහිත්‍යයට එක් වෙයි.

නමුත් මූලාශ්‍රය කතාව ගීයට නැගීමේ දී ඇතැම් අවස්ථා ඒ ආකාරයෙන් ද, තවත් අවස්ථා බැහැර කරමින් ද බැහැරින් කොටස් එකතු කරමින් ද විවිධ සංස්කරණ සිදු කර තිබේ. එහෙයින් කුස ජාතකය හා කව්සිළුමිණ අතර සමවිෂමතා සහ ඇතැම් විටෙක දුර්වලතා ද දැකිය හැකි ය. මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කරන්නේ කව්සිළුමිණ කතුවරයා ජාතක කතා සංග්‍රහයෙහි එන කුස ජාතකය මූලාශ්‍රය කර ගැනීමේ දී සංස්කරණයට ලක් වී ඇති ආකාරය පිළිබඳ ව විමසා බැලීම යි.

02. ක්‍රමවේදය

පූර්ව කියැවීම් හා න්‍යායාත්මක ප්‍රවේශයන්ට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනය යොදා ගැනිණ. මෙහි දී කව්සිළුමිණ හා කුස ජාතකය පිළිබඳ සංස්කරණ ඇතුළු ඊට අදාළව මෙතෙක් ලියැවී ඇති සාහිත්‍ය විමර්ශන පරිශීලනය කිරීම සිදු විය. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අධ්‍යයනයට බඳුන් කෙරෙන විෂය පිළිබඳ ව ප්‍රාමාණික උගතුන් විසින් රචිත පොත්පත් හා ලිපි ලේඛන දේශාටන වාර්තා, වංශකතා හා ඉතිහාස ග්‍රන්ථ ආදී ඓතිහාසික සහ සාහිත්‍යයික මූලාශ්‍රය ඇසුරෙන් තොරතුරු එක්රැස් කෙරිණ. ද්විතීය මුලාශ්‍රය ලෙස වෙබ් අඩවි සහ විද්‍යුත් ලේඛන වැනි සම්පත් යොදා ගැනුණි.

03. ප්‍රතිඵල හා සාකච්ඡාව

3.1. කුස ජාතකය හා කව්සිළුමිණ

3.1.1. බැහැර කිරීම්

විරූපී මිනිසෙකු සුරූපී ලලනාවකට පෙම් කිරීම නිසා ඇති වන ගැටලු මත විකාසනය වන කුස ජාතකය, මාගමක කෙරෙහි ලෝල සිත් ඇති වූ භික්ෂුවක් අරභයා ගෙන හැර දැක්වූ බව ජාතක පොතෙහි සඳහන් වෙයි. එය තත්වාකාරයෙන් කීම කව්සිළුමිණෙහි ආකෘතියෙන් බැහැර වීමකි. එයින් මහාකාව්‍ය ආකෘතියේ අනිවාර්ය අංග වූ විවාහ, විප්‍රලම්භ, රතොත්සවය ආදී අවස්ථා වර්ණනා කිරීමේදී බාධා පමුණුවන බැවින් කව්සිළුමිණ කවියා කුස ජාතකයෙහි වර්තමාන කතාව මුළුමනින් ම ඉවත් කර ඇත. එහෙයින් කව්සිළුමිණෙහි එන වර්තමාන කතාන්දරය ඉතා කෙටි වූවකි.

"මහණ, තා ශාසනයේ උකටලීවූයේ සැබෑදැයි විචාරා වදාරා සැබෑව ස්වාමීනි දැන්වූ කල්හි මහණ, ක්ලේශ වසඟව නොපවතුව. මේ මාතුගාමයෝ නම් පවිටු සත්‍ව කෙනෙකැයි ඔවුන් කෙරෙහි පිළිබඳ සිත් හැර ශාසනයෙහි ඇලී වාසය කරව. ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් නිසා තේජස්වී වුත් පුරාතනයෙහි නුවණැත්තෝ තේජසින් පිරිහී නොයෙක් ව්‍යසනයට පැමිණියාහු වෙත්දැයි විචාරා වදාරා භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ..."[1]

එසේ ම අතීත කථාවෙහි එන ප්‍රධාන සිදුවීම් ද මහා කාව්‍ය ආකෘතියට අභිමත පරිදි සකස් කිරීමට කව්සිළුමිණ කවියා උත්සාහ ගනියි. කුස ජාතකයට අනුව කුස යනු සක්විති රජෙක්, සකල ශිල්පයෙහි දක්ෂයෙක් වුව ද විරූපිකයෙකි. පබවත මුලා කොට විවාහ කරගත්ත ද කුස රජුගේ හැසිරීම නිසා ඔවුන් වසන් කළ කරුණ අනාවරණය වීමෙන් ඇය කුස රජු හැර දමා නැවත සිය දෙමාපියන් වෙත යන්නී ය. මෙම අවස්ථාව දැක්වීමේ දී ජාතක කතාකරුවා අතීත අකුසල කර්මය පිළිබඳ ව දක්වයි.

"යටගිය දවස බරණැස් නුවරට නුදුරු ගමෙක්හි වීදි දෙකක කෙළෙඹි කුල දෙකක් ඇත්තේ ඉන් ගෙයක පුත් දෙදෙනෙක් වූහ. ඉක්බිති බෝධිසත්වයෝ බාල මලණුවෝ හ. අනික් කෙළෙඹි කුලයෙහි දියණි කෙනෙක් වූහ.... එවෙලෙහි සිගා වැඩි පසේ බුදු

කෙනෙකුන් වහන්සේ දැක බෝධිසත්වයන්ගේ බෑදෑනියෝ උන්ට කැවුම් පසු ව පිස දින හැක්කැයි සිතා බෝධිසත්වයන්ට තිබූ කොටස පිළිගැන්වූහ. බෝධිසත්වයෝ තොප සන්තක කොටස කා පියා මාගේ කොටස දන් දෙන්නට කාරණා කිම්දැයි කිපී ලුහුබඳවා ගොසින් පසේ බුදුන් වහන්සේගේ පාත්‍රයේ තුබූ කැවුම් අරගත්තු ය."[2]

එහෙත් කව්සිළුමිණ කතුවරයා මෙම පූර්ව කර්මය දැක්වෙන කොටස ඇතුළත් නොකරන අතර කුස රජු විරූපිකයෙකු බව ද සඟවයි. ඒ වෙනුවට "නිරිඳු අප ලෝ පහනෙක්"3 යනුවෙන් කුස රජු පහනකට සමාන කර දක්වයි. ඊට හේතුව වන්නේ මහාකාව්‍යයක එන කථානායකයා විරූපිකයෙකු කෙරෙන් නිරූපණය කළ නො හැකි බැවිනි. තම කතා නායකයා හීන ලක්ෂණවලින් යුතු නායකයෙකු කරවීම කාව්‍යයේ ඖචිත්‍යයට හානිකර ය.

"මුළු ලෝ නෙත බඳන මනකල් කලුන් නෙත් සිත්
විසී කරන ගුණ නදන් නිරිඳු අප ලෝ පහනෙක්"[4]

දෙවන සර්ගය ආරම්භයෙහි එන කුස රජ පිළිබඳ නායක වර්ණනයේ දී හමුවන ඉහත පද්‍යය කුසගේ විරූපීභාවය යටපත් වන පරිදි ඔහුගේ වීර තේජාන්විතභාවය හා කලා නෛපුණ්‍ය වර්ණනයට ලක් කිරීමකි. එහෙත් ජාතක කතාකරුවා කුස ලවා ම ඔහුගේ විරූපීභාවය ප්‍රකාශ කරයි. ඇතැම් තැනක දී හමුවන ප්‍රභාවතියගේ ප්‍රකාශ ද අතිශය කර්කෂ ය.

"රූපශ්‍රීන් යුක්ත වූ රාජ කුමාරිකාවක් ගෙනෙන ලද්දේ වූ නම් මා දැක යකෙකු මෙන් විරූප වූ මොහු මට කම් කිම්දැයි පලා යන්නී ය."[5]

"ඔහුගේ මුඛය දැක යක්ෂයෙක් මා අත අල්වා ගතැයි..."[6]

"නුඹ වහන්සේ වැනි සකුරු පුවක් සේ දා හැලී ගිය මුහුණ ඇති යකින්නක් අග මෙහෙසුන් කොට..."[7]

කව්සිළුමිණ කතුවරයා කුසගේ මුවින් ඔහුගේ විරූපීභාවය ප්‍රකාශ නොකරන අතර එය පබාවතිය ලවා පමණක් ම සිදු කරවයි. කථාවේ උච්චතම අවසථාව වන පබාවතිය කුස රජු හැර දමා සිය දෙමාපියන් වෙත යාමට හේතු වූ දිය කෙළින අවස්ථාවේ කුස රජ ඇ වැළඳ ගැනීමේ සිදුවීමේ දී "අහෝ දිය රකුසෙක්" යැයි බියට පත් වන පබාවතී "මෙ යක් ලූ මා හිමි" යනුවෙන් ශෝකයට පත් වීම ඒ සඳහා එක් නිදසුනකි.

"මෙ යක් ලූ මා හිමි පබවත්ලු ඔහු විඳිනී

නිසයුරු අඳුරු කො සමඟ ගොවපයෙ කො හස් ඉසුබුම්"[8]

එයින් පෙනී යන්නේ මහා කාව්‍ය ආකෘතියට අනුගත වීම පිණිස කව්සිළුමිණ කතුවරයා අවශ්‍ය ම අවස්ථාවක දී හැරුණු කොට අන් තන්හි දී කුසගේ අනන්‍යතාව සැඟවීමට උත්සුක වී ඇති බවයි. එමඟින් කතුවරයා සම්ප්‍රදාය අතික්‍රමණය කරමින් නවතාවක් ප්‍රකට කිරීමට දරන උත්සාහය හඳුනාගත හැකි ය.

ජාතක කතා, ආකෘතිය අනුව ප්‍රධාන වශයෙන් කොටස් පහකි. එනම්, පච්චුප්පන්නවත්ථු (වර්තමාන කථාව), අතීතවත්ථු (අතීත කථාව), ගාථා (ජාතක පාලියේ එන ගාථාව හෝ ගාථා), වෙය්‍යාකරණ (ජාතක ගාථාවලට අදාළ අර්ථ වර්ණනාව නැතහොත් අට්ඨකථා හෙවත් ගාථාවට අර්ථ දැක්වීම), සමෝධාන (පූර්වාපර සන්ධි ගැළපීම හෙවත් අතීත හා වර්තමාන කථා ගැළපීම) යනුවෙනි. ඒ අනුව ජාතක පොතෙහි සෑම ජාතකයක් ම ප්‍රාරම්භ අතීත, අවසාන යන කොටස් තුනකින් සමන්විත වෙයි.

ප්‍රාරම්භ - ජාතක කථාව ගෙන හැර පෑමට බුදුන්වහන්සේ පෙළඹුන ආකාරය ප්‍රාරම්භ නම් වේ

අතීත - ප්‍රාරම්භ කථාව සනාථ කිරීමට ඒ හා සම්බන්ධව පැවති ඉකුත් විස්තරය අතීත කථාව යි

අවසාන - බෝධිසත්ව හෙවත් ජාතක කථාව අතීත කථාවේ අවසානයේ එන ප්‍රාරම්භ කථාවත් සමඟ ගලපා කළ දේශනය මෙයින් අදහස් වෙයි

එහෙත් කව්සිළුමිණ කවියා කුස ජාතකයෙහි එන අතීත කථාව ඉවත් කර ඇති නිසා ජාතක කථාවක එන පූර්වාපර සන්ධි ගැළපීමේ අවස්ථාව හෙවත් සමෝධාන අවස්ථාව දකින්නට නොලැබේ.

කුස ජාතකය ආරම්භ වන්නේ කුස රජුගේ උපතට අදාළ සිදුවීම් පිළිබඳ විස්තරයකිනි. දරුවන් නොවූ දඹදිව මල්ල රට කුසාවතී නුවර ඔකාවස් රජුට හා සීලවතී බිසවට ශක්‍ර දේවේන්ද්‍රයාගේ මැදිහත්වීමෙන් දරුවන් දෙදෙනෙකු ලැබෙන බවත්, වැඩිමහලු කුමාරයා විරූපී කුස වන බවත් ඉන් කියැවෙයි.

"යටගිය දවස මල්ල රට කුසාවතී නුවර ඔක්කාක නම් දැහැමි රජ කෙනෙක් රාජ්‍ය කරන්නාහ. ප්‍රධාන බිසව සීලවතී නම් වූවා ය. ඈ ප්‍රධාන සොළොස් දහසක් පුරාංගනාවන්ට දරුවන් නැත්තාහ. එ කල නුවර වැස්සෝ එක් ව අපගේ රාජ්‍ය ගෙන යාමට කුමාරයෙක් නැතැ යි රාජාංගනයට රැස් ව කෝලාහල කරන්නට වූහ...."[9]

කව්සිළුමිණ කතුවරයා මෙම විස්තරය ඕලාරික බැවින් සිය කෘතියට අනුචිත වර්ණනාවක් ලෙස සලකා බැහැර කරයි.

3.1.2. සංශෝධනය කිරීම්

කුස ජාතකයේ දී කුස රජුගේ ළමා කාලය පිළිබඳ විස්තරයක් දක්වා ඔහු අභිශේක කොට විවාහ කර දිය යුතු බව පවසනු ලවන්නේ කුස රජුගේ පියා වන ඔක්කාක රජු විසින් මව් වන සීලවතී බිසවට ය.

"කුස කුමාරයා වැඩිවිය පැමිණ සියලු ශිල්ප දැන නිමාවට පත් කල්හි පිය රජතුමා කුමාරයන්ට රාජ්‍ය දෙනු කැමති ව බිසව කැඳවා දේවිනි, පුතණුවන් අභිෂේක කොට ශ්‍රී විභූතිය දැකුම්හ. මේ මුළු දඹදිව යම් රජකෙනෙකුන්ගේ දුවක් කැමති වේ ද උන් ගෙන්වා අග මෙහෙසුන් කරම්හ. සොයා බලව් යි කීහ..."[10]

එහෙත් කව්සිළුමිණ කවියා කුස රජුගේ ළමා කාලය පිළිබඳ කිසිවක් නො දක්වා කුස රජ, යුවරජ හා මව්පියන් හිඳිනා රාජ සභාවේ දී මෙහෙසියකගේ අවශ්‍යතාව තරුණ රජුට දක්වන්නේ අමාත්‍ය මණ්ඩලය යි.

"අප නිරිඳු සියොසිරි පත් රජසිරි සහාසිරි

නොලැබ ඒ පළඳනා විලසත නොලා රඳනා"[11]

ප්‍රභාවතියගේ රූපය පිළිබඳ ව රාජ දූතයන් ඔක්කාක රජුට පැහැදිලි කිරීමේ දී කුස කුමරු විවාහය ප්‍රතික්ශේප කරන්නේ තමා විරූපී පුද්ගලයෙකු බව දක්වමින් නො ව කාමයෙහි ආදීනව දන්නා බැවිනි.

"...ඒ අසා කුස කුමාරයෝ මම රූ නැතියෙමි. රූපශ්‍රීන් යුක්ත වූ කුමාරිකාවක් ගෙනෙන ලද්දේ නම් යකකු මෙන් විරූප වූ මොහුගෙන් මට කම් කිම් දැයි පලා යන්නී ය. ඒ අපට ලැජ්ජා කටයුතු වන්නේ ය. එ බැවින් මට ගිහිගෙයින් ප්‍රයෝජන නැත. මව්පිය උවටැන් කොට ඔවුන්ගේ ඇවෑමෙන් ගොස් මහණ වෙමියි සිතා ඒ අදහස කම්මිතියට කිවු ය."[12]

කව්සිළුමිණ කාව්‍යාරම්භයේ දී කුස රජු විරූපිකයෙක් යැයි නොපවසා කුසගේ විවාහය ගැන සාකච්ඡාව සිදු වන අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් ඔහු ලවා කාමයෙහි දොස් දැක්වීම කව්සිළුමිණෙහි එන ඖචිත්‍ය හීන අවස්ථාවක් බව මාර්ටින් වික්‍රමසිංහ පවසයි.

"ඉතා අවලස්සන පිරිමියෙකු වන කුස කුමාරයා ලවා ස්ත්‍රීන් ගේත් ගෘහ වාසයෙහිත් නුගුණ හා ආදීනව වර්ණණා කරවීම කතා වස්තුවත් කුස කුමරුගේ සුන්දර චරිතයත් උචිත ස්වරූපයෙන් හා රසභාවයෙන් ද පිරිහෙයි. ඇමතියන් හා මව්පියන් ද කළ විවාහ යෝජනා නොඉවසූ කුස කුමාරයාගේ කටට පැරකුම්බා රජ විසින් නගන ලද අනුචිත බණ දෙසුම නිසා, ඔහු කුහකයෙක් වෙයි. අවලස්සන පිරිමියෙකු කාන්තාවන්ගේත් ගෘහ වාසයෙහිත් දොස් පුන පුනා කීම අරූප ස්ත්‍රියකගේ පතිවත වැනුම වැනි

අනුචිත එකක් නොවන්නේ ද? ව්‍යාජ වර්ණනාවෙහි ආශාව නිසා කව්සිළුමිණ කර්තෘහු අනුචිත බණ දෙසුමක් කටට නැඟීමෙන් කුස කුමාරයාගේ සුන්දර චරිතය කෙලෙසන ලද නමුත් ජාතක වස්තුවෙහි නම්, කුස කුමාරයාගේ කටට නඟා තිබෙනුයේ ඔහුගේ චරිතය දීප්තිමත් කෙරෙන උචිත බසකි."[13]

එහෙත් ජාතක කතාවෙහි මෙන් ම කව්සිළුමිණෙහි ද දෙමාපියන් නැවත නැවත පෙරැත්ත කරමින් පරපුර ගක ගැනීමේ වැදගත්කම පහදා දීමෙන් පසු දෙමාපියන්ට අකීකරු වීම අකටයුතු බැවින් උපායක් ලෙස රන්රුව නිර්මාණය කරයි. ඊට දමාන රූ ඇත්තී සාගල රජුගේ දියණිය වූ ප්‍රභාවතී කුමාරිකාව යි.

ජාතක කතාකරුවා ප්‍රභාවතිය වර්ණනා කරන්නේ රූප මදයෙන් අහංකාර වූ චරිතකයක් ලෙස යි. සතුරු රජවරුන් සත් දෙනාට ප්‍රභාවතිය කැලි කොට බෙදා දීමට තීරණය කිරීමෙන් පසු සිය මෑණියන් වෙත දිව ගොස් වැළපෙන අවස්ථාවේ දී ඇගේ මුවින් ම සිය රූප ශෝභාව පිළිබඳ ව වර්ණණයට ලක් කරවීම ඊට නිදසුනකි.

"...මෑණියන් වහන්ස, මාගේ සඳුන් තුවරලා කස්තුරු කපුරු ආදී සුවඳ සුන්නෙන් උලා ඔප්නගන ලද ප්‍රියකරු වූ මාන ඇස් සඟලක් ඇත. නිමීල වූ කිසි කැලලක් නැති පෙම්බර වූ දළ කඩමිටු ඇති කැඩපතින් බල බලා සරහන ලද මාගේ මේ මුබ බිම්බය මේ සත් රජ්ජුරුවන් විසින් කපා දමන ලදුව වලා තිබෙන්නේ වේද? තව ද මෑණියන් වහන්ස බමර වැල සලා මෙන් අක්බඹරු සිනිඳු මොළොක් දික් වූ සඳුන් සාංද්‍ර ජබාදු ආදී වූ සුවඳ ගන්වන ලද මේ මාගේ කෙස් වැටිය අමු සොහොනෙහි දමන ලදුව උකුස්සෝ ගිජුලිහිණි ආදි වූ පක්ෂි සමූහයෝ නිය පසුරෙන් බදාගෙන ආකුල වැකුල කොට ඇත මැත අදිනනනෝ වේද?..."[14]

කුස ජාතකයේ මෙන් ම ජාතක කතා බොහෝවක දී ම කතුවරයා කාන්තාවන්ගේ චපල හා දුර්වල ගති ලක්ෂණ ඉදිරිපත් කළ ද කව්සිළුමිණ කවියා ප්‍රභාවතිය නිරූපණය කරන්නේ කාගේත් සෙනෙහස හා ආදරය ලැබිය යුතු ස්ත්‍රියක වශයෙනි.

"සැළමුතු නුගි නුරා රස විදුන පින් නැතියෙමි

තමේ විලසැසැ මතුයෙම් නුවනැතියෙලබ විඳියෙම්"[15]

මූලාශ්‍රය කතාවේ සඳහන් ආකාරයට කුසගේ මව වන සීලවතී බිසවගේ චරිතය මෙම විවාහය සම්බන්ධයෙන් විශාල කාර්යභාරයක් ඉටු කළ ද කව්සිළුමිණෙහි ඈ අවස්ථා කිහිපයක දී හැර ඉදිරියට එන්නේ නැත. කුස ජාතකයේ දී පබාවතිය කැඳවා ගෙන ඒමේ ගමනට ඔක්කාක රජු සමඟ සීලවතී බිසව එක් වුව ද කව්සිළුමිණ කතුවරයා එය විශාල සංස්කරණයකට ලක් කරමින් සීලවතී බිසව කුසාවතී නුවර හිඳුවා ඔක්කාක රජු පමණක් එම කාර්යය සඳහා යොදා ගන්නේ මහා කාව්‍යයට අවශ්‍ය ම අංගයක් වන මධුපානෝත්සවයට ඉඩ සලසා ගනිමිනි.

"සරහා සෙනඟ නා දනන් දන්වතෙ යතුරට

රිසි දා යොග මොහොත්නෙන් පියරජ එතෙර යා ගත"[16]

(250 කවිය)

කව්සිළුමිණ කවියා ඔකාවස් රජුගේ සගල්පුර ගමන සම්බන්ධ කොට සැඳෑ වැනුම්, නිසා වැනුම්, උදා වැනුම්, අවන්කෙළි වැනුම්, මනදොළ කෙළි වැනුම් ආදිය දක්වයි. එහෙත් මේ වර්ණනා අතර ඔකාවස් රජු හා පුරංගනාවක් සම්බන්ධ කොට දක්වන "සම්ප්‍රභෝග වර්ණනය" අනුචිත අවස්ථාවක් ලෙස ඇතැම්හු දක්වති. මනාලයා නො පෙන්වා මනාලිය කැන්දාගෙන ඒමට යන ගමනට අවම වශයෙන් කුසගේ මව හෝ සහභාගී නොවීමත් එහි දී එක් රැයක් නවාතැන් ගන්නා පියා සුරාමතින් මත් ව අන්‍ය පුරංගනාවක් හා රමණයේ යෙදීමත් තරමක් ව්‍යාකූල සිදුවීම් ය. මෙය කව්සිළුමිණ කතුවරයාගේ දුර්වල අවස්ථාවක් සේ පෙනෙයි. මෙම සම්ප්‍රභෝග වර්ණනය කාව්‍ය කර්තෘ රජුගේ තලතුනා විය පවා නො සලකා කරන ලද නොමනා වර්ණනයක් බව මාර්ටින් වික්‍රමසිංහ ද දක්වා තිබේ.[17]

ජාතක කථාවේ දී කුස රජු පබාවතිය දකින්නට කැමතිව මවට ඒ බව පවසා පෙරැත්ත කරයි. ඒ අනුව එක් අවස්ථාවක දී ඇත් හලට ගොස් ඇත් ගොව්වන් සමඟ සිටින්නට යැයි ඈ

ඔහුට පවසා පබවත ද කැටුව ඇත්හලට යන අවස්ථාවේ දී මේ අසවල් ඇතාය මේ අසවල් ඇතාය යනුවෙන් කියමින් සිටියදී කුස පබාවතීගේ ඇඟට ඇත් බෙට්ටකින් දමා ගැසීම ජාතක පොතෙහි දැක්වෙන්නේ "ඇත් ඉලත්තියෙන්" ගැසූ බව යි. එසේ ම නැවතත් පබාවතී දකින්නට කැමති ව අස්හලට කැඳවාගෙන ආ අවස්ථාවේ දී අස් බෙට්ටකින් ගැසීමේ සිදුවීම ජාතක කතාකරුවා දක්වන්නේ "අස් බෙට්ටක්" දමා ගැසූ ලෙස ය.

"එකල්හි සීලවතී දේවීන් ප්‍රභාවතීන් ඇත්හලට කැඳවාගෙන ගොස් මේ අසවල් ඇතාය මේ අසවල් ඇතායයි නම් දක්ව දක්වා යන සඳ කුස රජ්ජුරුවෝ ප්‍රභාවතීන් ගේ පිට ඇත් ඉලත්තියක් ගැසූහ.... තව ද කලෙකින් බෝධිසත්වයෝ ප්‍රභාවතීන් දක්නා කැමතිව පෙර පරිද්දෙන් ම මෑණියන්ට කියා අස්සලයක්හු පරිද්දෙන් සිට ප්‍රභාවතීන් දැක එතනදීත් අස්බෙට්ටක් ගැසූය."[18]

එහෙත් කව්සිළුමිණ කවියා තත් අවස්ථා දෙකෙහි දී ම එය දක්වන්නේ "තණකලබනෙන්" පහර දුන්නා යැයි කියා ය.

"වැළඹී ඇත රුවනතුරෙතර තණ කලබනෙන්
තමා දළ ලොබ කලබෙව් පහළ පබවත සත්සර"[19]
"ගැසී නැගී සිටැ කුසරජ යළි තණ කලබනෙන්
පබවත කෝමෙදෙනුදම් සුහුල් ඔවයින් රඳවත්"[20]

සිය බිරිඳට සත්ව වසුරුවලින් පහර දීම සදාචාර සම්පන්න නොවන දෙයකි. තව ද ඇත් බෙට්ටකින් හා අස් බෙට්ටකින් ගැසීමේ සිදුවීම ඉතා ග්‍රාම්‍ය අවස්ථාවක් යැයි කව්සිළුමිණ කතුවරයා අදහස් කළා විය හැකි ය. එහෙයින් ඔහු ඇත් හා අස් ඉලත්තිය වෙනුවට තණකොළ රොදකින් පහර දුන් බව ප්‍රකාශ කළා විය හැකි ය. එය කථා නායකයාගේ චරිතයට හානියක් නොවන පරිදි තරුණ පෙම්වතෙකුගේ කෙළිලොල් ස්වභාවය ඉස්මතු කිරීමට ගත් උත්සාහයක් ලෙස පෙනෙයි.

ජාතක කතාකරුවා "කුදීගේ චරිතය" නිරූපණය කරන්නේ කුදු විරූපී තැනැත්තියක ලෙසිනි. ඇමතියන් මහ පෙරහරින් අවුත් සාගල නුවර මංකඩ සිටුවා ඇති රන්රුව දැක "මේ නොකීකරු දරුවෝ අප පැනට එවා තුමූ ඒ වේලෙහි පළමු කොට අවුදින් මෙතන සිටියෝය. රජ කුලයට පරිභව උපදවන්නාවූ කෙල්ල ඉදින් රජ්ජුරුවන් වහන්සේ දත් සේක් වී නම් අප හැම නසාපියන සේකැයි"[21] කිපී කම්මුලට පහරක් ගැසීමත්, එකෙණෙහි අත්ල පැලී යන තරම් වේදනාවක් දැනීමත් කුදීගේ චරිත පිළිබඳ යම් අදහසක් පාඨකයාට ලබා දෙයි. එහෙත් කව්සිළුමිණ කතුවරයා එය තරමක් වෙනස් කර"පැහැර මොළොක් අතින්"[22] යනුවෙන් කුදීගේ පහර දීම දක්වන්නේ මොළොක් අතින් සිදු කළ පහර දීමක් ලෙස ය. එසේ ම කුස ජාතකයෙහි කුස රජ තමාට පිසින රජ බොජුන් කුදීට ද ඇගේ නීරස ආහාර පබාවතිය ද බුදින බව සඳහන් වන සිදුවීමේ දී කව්සිළුමිණ කවියා කුදී වෙනුවට යහළු ස්ත්‍රියක් යැයි යොදාගෙන තිබේ.

මහා කාව්‍ය ආකෘතියට අනුගත විය යුතු නිසා කව්සිළුමිණ කතුවරයා විසින් සංක්ෂිප්තතා ගුණය ආරක්ෂා කරමින් සංස්කරණය කරන ලද අවස්ථා අතර ප්‍රභාවතිට කුස රජු දැකීමට ආශා ඇතිව ඒ බව සීලවතී බිසවට පැවසීමෙන් පසු සීලවතී බිසව, ඉදිරියෙන් ජයම්පතී කුමරු ද ඔහුට පසුපසින් කුස රජු ද සිටින සේ ඇතු පිට නංවා ප්‍රභාවතියට දක්වන අවස්ථාව ප්‍රධාන වෙයි. ජාතක කතා කතුවරයා එය සවිස්තරාත්මක ව ඉදිරිපත් කරද්දී කව්සිළුමිණ කවියා ඒ සඳහා ගී තුනක් පමණක් යොදා ගෙන සංක්ෂිප්ත ලෙස දක්වයි. ඉක්බිති ඇඹෙන්නේ මේකල් වැනුමක්, සරාකල් වැනුමක් හා උයන්කෙළි වැනුමකි. ඒවා ජාතක කතාවෙන් වෙනස් වූ වර්ණනා ය. එසේ ම කුස රජු පබාවතිය දිය කෙළින අවස්ථාවේ දී නෙළුම් මලකට මුවා වී සිට ඇගේ අත අල්ලා ගැනීමේ අවස්ථාව කව්සිළුමිණෙහි දැක්වෙන්නේ උයන්කෙළි වැනුමකින් හා දියකෙළි වැනුමකින් අනතුරු ව යි. කුසගේ සැබෑ රූපය දැක සිය දෙමාපියන් වෙත යාමට සැරසෙන පබාවතියට ඇමතිවරුන් සහ යෙහෙළියන් ඔවා දී ඇය නතර තර ගැනීමට උත්සාහ කිරීම ද කව්සිළුමිණෙහි පමණක් සඳහන් වන්නකි.

ජාතක කථාවෙහි එන පබාවතිය තමා කෙරෙහි ස්නේහ ඇත්දැයි පරීක්ෂා කොට බලනු පිණිස කුස රජ වලං කඳ සමඟ වංචාවෙන් ඇද වැටුණ කල්හි ඈ වහා පැමිණ පහත් වී මුහුණ ළං කොට බැලීමේ සිදුවීම ඇසුරෙන් කව්සිළුමිණ කවියා පබවත වලප පබඳියි. එහි අවසානයේ එන කුස රජ කෙළ කටක් පුරාගෙන ඇගේ මුහුණට කෙළ ගැසීමේ සිදුවීම ජාතක කථාවෙහි දැක්වෙන්නේ හුදු කෙළ ගැසීමක් ලෙස යි.

"ප්‍රාණය ඇද්දැයි නැද්දැයි පරීක්ෂා කෙරෙමියි සිතා භයගෙන ගෙන් පිටත් ව බෝධිසත්වයන්ගේ ස්වාසය පරීක්ෂා කරනු පිණිස නැඹුරුව මුහුණ බැලුව. එසඳ කුස රජ්ජුරුවෝ කොල කටක් පුරා ගෙන ප්‍රභාවතීන් මුහුණට දැමූහ."[23]

එහෙත් කව්සිළුමිණ කතුවරයා එය දක්වන්නේ විලාපයෙන් ශාන්ත වූ පබවතගේ චක්ත්‍රය නැමති පද්මයෙහි රජිඳු තෙමේ සැපින් මකරන්දය දීමක් ලෙසිනි.

"වැලැපිනිති සරත පබවත වත පියුම්හී

මුවරද දිනි සැපිනිසිඳු දැහැ හිස් හො නැඟි මහලට"[24]

ඉහත ආකාරයෙන් එය කව්සිළුමිණෙහි දැක්වෙන්නේ මෙය කෙළ ගැසීමක් නොව ප්‍රේමය ප්‍රකාශ කිරීමේ චාරිත්‍රයක් වශයෙන් සැලකිය හැකි ය. බුලත් සැපීම පෙම් කෙළියේ අංගයක් බවත් අවල කෙළියට පළමු බුලතින් කට සරහා ගැන්ම චිරන්තන සම්ප්‍රදායක් වූ බවත් කාව්‍යශේඛරය වැනි පශ්චාත්කාලීන කෘතීන්ගෙන් මෙන් ම දැනට නෂ්ටප්‍රාප්ත ඉපැරණි කාව්‍යන්ගෙන් ද දත හැකි ය. එළු සඳැස් ලකුණේ මිණිමල් විරිතට නිදසුන් ලෙස දක්වන පහත ගීය ද ඉපැරණි කුස දා කවට අයත් විය යුතු වන්නකි.

"හළ ද බුලත වත රත ලවනත
මිණිමුතුපුල පත පැහැගත නෙත
සිසි කැලුම පත සිසි වත වත
එ නිරිඳු මන නෙත ගත පබ වත"[25]

වක්ත්‍රයෙහි බුලත හෙළද්දී රත් ඕෂ්ඨ යුත් නිල් මහනෙල් පත්‍රයෙක් හි පැහැය ගත් නෙතින් යුතු වූ චන්ද්‍ර කාන්තියට පත් සිනහසෙන වක්ත්‍ර ඇති ප්‍රභාවතී තොමෝ එ නිරිඳුන් ගේ මනසත් නෙතත් ග්‍රහණය කළහ යන්න එහි අර්ථය යි.

ශක්‍රෝපක්‍රම සම්බන්ධ අවස්ථාවේ දී කුස රජු අතැර පැමිණ සිටින පබාවතී සරණපාවා ගැනීමට එන රජවරුන් සත්දෙනා පිළිබඳ සිදුවීම ජාතක කථාකරුවා දක්වන්නේ පබාවතිය සත්කඩකට පළා ඔවුන්ට දෙන බවකි.

"එබස් අසා රජ්ජුරුවෝ එක් කෙනෙකුට ප්‍රභාවතී පාවා දිනුමෝ නම් තෙස්සෝ යුද්ධ කරන්නාහ. එහෙයින් එක්කෙනෙකුන්ට දී සන්හිඳවිය නො හැක්ක. මුළු දඹදිව අග්‍රරාජන්ව සිටි කුස රජ්ජුරුවන් හැරපියා ආ ගමනට විපාක දක්වමි. මෑ සත්කඩක් කොට කපා රජදරුවන් සත්දෙනාට දී පියා ගැලවෙම්වයි කිවුය."[26]

එහෙත් කව්සිළුමිණ කතුවරයා එය වෙනස් කරමින් පිය රජු විසින් පබාවතිය සත්කඩකට කපා දෙනු වෙනුවට ඒ වචන නැමති යුගාන්ත මාරුතයෙන් පහර ලැබ, මුහුද ගොඩට ගලා ගිය විලාසයක් දක්වමින්, චතුරංගනී සේනාව සමඟින් රජතෙමේ නික්මුණි. යනුවෙන් ඔහු අමාත්‍ය මණ්ඩලය ඉදිරියේ සිංහ ගර්ජනා කොට යුද්ධයට පිවිසෙන බව කියයි.

"වදනෙ යුගත් නල ගස් ලද මුහුදු මිහිතෙලෙ
දිවු විලසක් පාමින් රජ සිවුරඟින් යා ගත්"[27]

මෙහි දී යුද වැනුමක් සඳහා අවකාශ සලසා ගන්නා කව්සිළුමිණ කතුවරයා මහා කාව්‍යයෙක්හි නායකයන් රණකාමී අභිත පුරුෂයන් බව ඒත්තු ගැන්වීම සඳහා උත්සුක වෙයි.

මුළුතැන්ගෙහි සිටින කුස රජු පිළිබඳ ව පබාවතිය ගොස් සිය මෑණියන්ට පැවසුව ද ඇය එය නොපිළිගත් කල්හි පබාවතී විසින් ම මව කැඳවාගෙන ගොස් කුස රජු දක්වන ලද අවස්ථාව

සහ ඒ බව මද්‍ර රජුට පැවසීමෙන් පසු "නුවණ නැති තැනැත්තිය මහා බල පරාක්‍රම ඇති කුස රජ්ජුරුවන් කරා ගොස් ක්ෂමා කරවා ගනුව" යි28 පබාවතිය කුස වෙත යවන අවස්ථාව ද කව්සිළුමිණෙහි දැක්වෙන්නේ වෙනස් ආකාරයෙනි. එයට අනුව පබාවතිය පමණක් නොව කුස රජු මුළුතැන්ගෙයි සිටින බව දැනගන්නා මද්‍ර රජ, මන්ත්‍රීන් සහ පුරස්ත්‍රීන් යන සියලු දෙනා එක් ව ගොස් ඔහුගෙන් සමාව අයැදියි. එහි දී කුස විසින් මුළුතැන්ගෙයි ඉදිරිපස මඩ කරනු ලබන්නේ හුදෙක් පබාවතියගේ මානය බිඳීමට පමණක් බව ජාතක කතාතරුවා පැවසුව ද කව්සිළුමිණෙහි එය සඳහන් වන්නේ පිරිස ඔහු වෙත පැමිණෙත්දී පවා ඔහු මුළුතැන්ගෙයි පාගමින් මඩ කළ බව ය.

> "මුළුතැනහී කියත පබවත ඉහි බුරපියන්
> මදුරජ මැතිගණ හා සහ සොම්නසින් යා ගත්"[29]

තව ද කුස රජු ප්‍රභාවතිය පාවා ගැනීමට පැමිණි රජවරු සත්දෙනා සමඟ සටනට යන අවස්ථාව ජාතක පොතෙහි ඉතා සංක්ෂිප්ත ව දැක්වෙතත් කව්සිළුමිණෙහි තරමක් දීර්ඝ ව වර්ණනා කොට තිබෙන්නේ මහාකාව්‍ය සම්ප්‍රදායට අනුගත වීමට විය යුතු ය. අතීත කතාවේ අවසානය ද ජාතක පොතට සාපේක්ෂ ව කව්සිළුමිණෙහි තරමක් වෙනස් වී ඇත. කුස ජාතකයේ දී අතීත කතාව නිම වන්නේ "එතැන් පටන් ප්‍රභාවතීන් හා කුස රජ්ජුරුවන් හා දෙදෙන ඒකාත්මික ව සමඟ වාසයෙන් දිවිපමණින් දසරාජදහමින් යුක්ත ව රාජ්‍යශ්‍රී අනුභවකොට කෙළවර කම් වූ පරිද්දෙන් සංසාර යාත්‍රා කළාහු"[30] යනුවෙනි. එහෙත් කව්සිළුමිණ කවියා මෙම අවස්ථාව නිරූපණය කිරීම සඳහා අවසන් සර්ගය ම වෙන් කරයි.

> "එතුර තුරිනැදැ වැලදි පබවත වතිඳු මඬලෙන්
> දෙගුරු නුවනත සඳකැන් මිණින් වගුළැස් දරතෝ"[31]
> "දළ දත් පියවදන් සමඅතිනි අතසරණෙන්
> සිවුසඟරවත්නෙන් ලෝ සගත් නරවිරු අරියොර"[32]

මේ සෑම ගීයක් ම පාහේ අලංකාරවාදයේ එන නියමයන් අනුගමනය කරමින් දීර්ඝ වශයෙන් වර්ණණයට ලක් කර ඇති බව පෙනේ.

04. සමාලෝචනය

කව්සිළුමිණ රචනා වන්නේ මහාකාව්‍යයක් ලෙස වන බැවින් මහාකාව්‍යයක අන්තර්ගත විය යුතු ලක්ෂණ අන්තර්ගත කිරීමටත්, උචිත පරිදි කතා වස්තුව සංස්කරණය කර ගැනීමටත් කර්තෘවරයාට විවිධ සංස්කරණය සිදු කිරීමට විය. එබැවින් එම සංස්කරණයේ අනවශ්‍ය හා අභව්‍ය සිදුවීම්, වර්තමාන කතාව, වෙයාකරණ සහ සමෝධානය වැනි අංග කිහිපයක් ම කතුවරයා විසින් ඉවත් කරනු ලැබ තිබේ. එසේ ම කතාවෙහි චරිත හා සිද්ධි අතර සමවාය සම්බන්ධය නොබිඳෙන පරිදි හා මුඛ්‍ය රසය වන ශෘංගාරය මතු කරගත හැකි පරිදි මූලාශ්‍රය කතාව සංස්කරණය කිරීම නිසා ජාතක කථාවට සාපේක්ෂ ව කව්සිළුමිණෙහි සංවර්ධිත අවස්ථා සහ දුර්වල තැන් ද දකින්නට ලැබෙන නමුත් සමස්තයක් වශයෙන් සලකා බැලීමේ දී ජාතක කථා ඇසුරු කරගෙන කාව්‍යකරණයේ නියැලි සෙසු කවීන්ට වඩා කව්සිළුමිණ කවියා කාව්‍යෝචිත අවස්ථා තෝරා බේරා ගැනීමේ දී පැහැදිලි නිපුණත්වයක් දක්වා ඇති බව පෙනෙයි.

05. මූලාශ්‍රය

ආරියපාල, ඇම්. බී. (සංස්.) *කව්සිළුමිණ*. (2004). කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගම්ලත්, සුචරිත. *කව්සිළුමිණ විනිස*. (1966). කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණය.

පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

වික්‍රමසිංහ, මාර්ටින්. *ජාතක කතා විමසුම*. (1968). රාජගිරිය: සී/ස සරස (පෞද්ගලික) සමාගම.

වික්‍රමසිංහ, මාර්ටින්. *සිංහල සාහිත්‍යයේ නැගීම*. (1997). දෙහිවල: තිසර ප්‍රකාශකයෝ.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර. *සිංහල සාහිත්‍ය වංශය*. (2020). කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝරත හිමි, වැලිවිටියේ. (සංස්.). *එළු සඳැස් ලකුණ*. (2015). කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හේරත්. සමන්ත, ජයමාන්න. පර්සි (සංස්.) *සාහිත්‍යය - අර්ධ වාර්ෂිකය*. (2012). රාජ්‍ය සාහිත්‍ය අනුමණ්ඩලය.

ආන්තික සටහන්

1. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1260 පිටු.
2. එම. 1266 පිටු.
3. ආරියපාල, බී. ඇම්. (සංස්.). කව්සිළුමිණ හෙවත් කුසදාවත. (2012). කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 38 පිටු. 67 ගීය.
4. එම. 38 පිටු. 67 ගීය.
5. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1262 පිටු.
6. එම. 1265 පිටු.
7. එම. 1269 පිටු.
8. ආරියපාල, බී. ඇම්. (සංස්.). කව්සිළුමිණ හෙවත් කුසදාවත. (2012). කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 311 පිටු. 531 ගීය.
9. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1260 පිටු.
10. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1262 පිටු.
11. ආරියපාල, බී. ඇම්. (සංස්.). කව්සිළුමිණ හෙවත් කුසදාවත. (2012). කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 38 පිටු. 68 ගීය.
12. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1262 පිටු.
13. වික්‍රමසිංහ, මාර්ටින්. සිංහල සාහිත්‍යයේ නැගීම. (2016). රාජගිරිය: සී. ස සරස (පෞද්ගලික) සමාගම. 54 පිටු.
14. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1273 පිටු.
15. ආරියපාල, බී. ඇම්. (සංස්.). කව්සිළුමිණ හෙවත් කුසදාවත. (2012). කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 372 පිටු. 633 ගීය.

16. එම. 140 පිටු. 250 ගීය.

17. වික්‍රමසිංහ, මාර්ටින්. සිංහල සාහිත්‍යයේ නැගීම. (2016). රාජගිරියඃ සී. ස සරස (පෞද්ගලික) සමාගම. 60 පිටු.

18. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1264 පිටු.

19. ආරියපාල, බී. ඇම්. (සංස්.). කව්සිළුමිණ හෙවත් කුසදාවත. (2012). කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 221 පිටු. 385 ගීය.

20. එම. 225 පිටු. 390 ගීය.

22. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1263 පිටු.

23. ආරියපාල, බී. ඇම්. (සංස්.). කව්සිළුමිණ හෙවත් කුසදාවත. (2012). කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 92 පිටු. 163 ගීය.

24. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1270 පිටු.

25. ආරියපාල, බී. ඇම්. (සංස්.). කව්සිළුමිණ හෙවත් කුසදාවත. (2012). කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 378 පිටු. 641 ගීය.

26. සෝරත හිමි, වැලිවිටියේ. (සංස්.). එළු සඳැස් ලකුණ. (2015). කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 50 පිටු.

27. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1273 පිටු.

28. ආරියපාල, බී. ඇම්. (සංස්.). කව්සිළුමිණ හෙවත් කුසදාවත. (2012). කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 388 පිටු. 660 ගීය.

29. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1277 පිටු.

30. එම. 417 පිටු. 708 ගීය.

31. පන්සිය පනස් ජාතක පොත. (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1280 පිටු.

32. එම. 451 පිටු. 758 ගීය.

33. ආරියපාල, බී. ඇම්. (සංස්.). කව්සිළුමිණ හෙවත් කුසදාවත. (2012). කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 456 පිටු. 765 ගීය.